# ගෝලීය තිරසාර සංවර්ධන අභිමතාර්ථයන්, පුරාණ රජරට පාලකයන් හෙළ සමාජයෙහි ලා ක්‍රියාත්මක කළ ආකාරය පිළිබඳව සිදු කෙරෙන විමර්ශනාත්මක අධ්‍යයනයක්

*එල්.ආර්.ඩබ්ලිව්.එල් ලියනගේ* [1]

තිරසාර සංවර්ධනය යනු පාරිසරික සමාජීය හා ආර්ථික යන ත්‍රිත්වමානයන් සුසංයෝජනය වූ දිගුකාලීන  සමෘද්ධියක් ලබා ගැනීමෙහි ලා ඒකාබද්ධ වූ ප්‍රවේශයකි. ඒ තුළ මිනිසා මූලිකවම පරිසරයේ පවත්නා සම්පත් වලින් ප්‍රයෝජනය ගන්නා අතර ම අනාගතය උදෙසා ද ඒවා සුරක්ෂිත කරණු ලබ යි. ඒ අනුව ගෝලීය වශයෙන් තිරසාර සංවර්ධනය 2030 වන විට සාක්ෂාත් කරගැනීමට අපේක්ෂා කර ඇත. ඒ සඳහා ඇමරිකානු නිව්යෝර්ක් සමුළුවේ දී තිරසාර සංවර්ධන අභිමථාර්තයන් 17කින් යුත් න්‍යාය පත්‍රයක්  ඉදිරිපත් කරනු ලැබී ය. මෙම තිරසාර සංවර්ධන අභිමාථාර්තයන් පිළිබඳ අවධානය යොමු කරමින් ඒවා පුරාතන ලංකාවේ දක්නට ලැබූ ආකාරය පිළිබඳ අධ්‍යයනය කිරීම වැදගත් වේ. ඒ අනුව 2015 ඉදිරිපත් කළ ගෝලීය තිරසාර සංවර්ධන අපේක්ෂිත අරමුණු, පුරාතන රජරට ශිෂ්ටාචාර පාලකයන් එදා හෙළ සමාජයෙහි ලා සාක්ෂාත් කරගත්තේ කෙසේද යන්න මෙහිදි පර්යේෂණ ගැටලුව ලෙස යොදා ගෙන ඇත. එසේම ගෝලීය තිරසාර සංවර්ධන අභිමතාර්ථයන්, පුරාණ රජරට පාලකයන් හෙළ සමාජයෙහි ලා ක්‍රියාත්මක කළ ආකාරය පිළීබඳව අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණය සඳහා උපයුක්ත අධ්‍යයන අරමුණ විය. මෙහිදී අධ්‍යයන ක්‍රමවේදය ලෙස ගුණාත්මක දත්ත රැස් කිරීමේ පර්යේෂණ ක්‍රමවේදය යටතේ ද්වීතියික මූලාශ්‍ර අධ්‍යයනය කිරීම තුළින් දත්ත රැස්කරගෙන ඇත. තිරසාර සංවර්ධන අභිමතාර්ථයන් හඳුනා ගැනීමත්, එකී අභිමතාර්ථයන් රජරට පාලකයන් විසින් අතීතයේ සිට උපයෝගි කරගත් ආකාරය හඳුනාගැනීම මෙම පර්යේෂණයේ අරමුණු බවට පත් විය. ලංකාව තුළ වැදගත් කාලපරිච්චේදයක් ලෙස අනුරාධපුර, පොළොන්නරු සභ්‍යත්වය හඳුනාගත හැකි ය. විශේෂයෙන් ආර්ථික සමෘද්ධිය ඇති කිරීම , දිළිඳු බව අවම කිරීම හා ජනතාවගේ යහපැවැත්ම ප්‍රවර්ධනය, විස්මිත ජල කළමනාකරණය, අධ්‍යාපනයේ වූ දියුණුව, නාගරික දියුණුව, පාරිසරික භාරකාරත්වය වශයෙන් තිරසාර සංවර්ධන අරමුණු ගණනාවක් සාක්ෂාත් කරගැනීමෙහි ලා කටයුතු කළ බව කිව හැකි ය. මෙම නියැදියට අනුව පර්යේෂණ ප්‍රතිඵල ගත් විට එදා හෙළදිව පැවති තිරසාර සංවර්ධනය සඳහා අනුගමනය කළ උපක්‍රමයන් වසර සියගණනකට පසුව අදටත් ප්‍රයෝජනයට ගැනීම දක්නට ලැබේ. පැරණි ශ්‍රී ලාංකික රජවරු පරිසරයේ වැධගත්කම හා සංරක්ෂණය මැනවින් අවබෝධ කරගෙන ඇති අතර එකී අනුග්‍රහය ශ්‍රී ලාංකික නව පරපුර කෙරෙහි ඉමහත් ආදර්ශයක් සපයනු ඇත. මෙලෙස පර්යේෂණය තුළ දත්ත විශ්ලේෂණයේදී නිගමනය කළ හැක්කේ ගෝලීය තිරසාර සංවර්ධන අභිමතාර්ථයන්, පුරාණ රජරට පාලකයන් හෙළ සමාජයෙහි ලා ක්‍රියාත්මක කිරීම සඳහා මූලික වශයෙන් කටයුතු කළ බව ය.

**ප්‍රමුඛ පද** - *තිරසාර සංවර්ධනය, තිරසාර සංවර්ධන අභිමතාර්ථ, රජරට ශිෂ්ටාචාරය, ජල කළමනාකරණය ආර්ථික සුරක්ෂිතතාවය*

---

[1] මානවශාස්ත්‍ර අධ්‍යනාංශය, සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්ව විද්‍යාලය. lrwanisha98@gmail.com